# මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙකුගේ කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බෝදාගම සුමන හිමි

## හැඳින්වීම

මහජන පුස්තකාලයක් යනු යම් ප්‍රදේශයක ජීවත් වන මහජනතාවගේ භාවිතය සඳහා ඇති පුස්තකාලයකි. පාසල් පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, විශේෂ පුස්තකාල, ජාතික පුස්තකාල යන පුස්තකාල ප්‍රභේදයන් අතුරින් මහජන පුස්තකාලය ජනතාවට වඩාත්ම සමීපතම ආයතනය වේ. මෙහි දී ජාති, ආගම්, කුල, පන්ති ආදී විශේෂතාවන්ගෙන් තොරව යම් ප්‍රදේශයක ජීවත් වන මහජනයාගේ කියවීම් අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා පිහිටුවා ඇති පුස්තකාල මහජන පුස්තකාල ලෙස පොදුවේ නිර්වචනය කළ හැකිය (Malaysian Journal of Library & Information Science, Vol.1, no.2, December 1996: 95-98). 1972 දී සංශෝධිත මහජන පුස්තකාල සඳහා වන යුනෙස්කෝ ප්‍රඥප්තියෙහි මහජන පුස්තකාලයක අරමුණු මෙසේ පැහැදිලි කර ඇත. '' මහජන පුස්තකාලය ජීවමාන අධ්‍යාපනික, සංස්කෘතික හා සන්නිවේදන මාධ්‍යයක් වන අතර ජනතාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය වැටහීම, සාමය හා සුහදතාවය වර්ධනය කිරීමෙහි ලා උපයෝගී වන පොදු ආයතනයකි"(මහජන පුස්තකාල සඳහා යුනෙස්කෝ ප්‍රඥප්තිය - 1972 සංශෝධිත)

මීට අමතරව පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ මෙරට සිටි ඇදුරුවරියක් වන ඊශ්වරි කොරයා මහත්මිය මහජන පුස්තකාල පිළිබඳ මෙසේ පැහැදිලි කර දක්වයි. "රටේ අධ්‍යාපන තොරතුරු අවශ්‍යතා, සංස්කෘතික හා විනෝදාත්මක අවශ්‍යතා සපුරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරන බැවින් මහජන පුස්තකාලය ජාතියට ඉමහත් සේවාවක් සපයන ආයතනයක් වේ. මහජන පුස්තකාලය කෙනෙකුට වෙනත් අයෙකුගේ මැදිහත්වීමක් නොමැතිව නිදහසේ ඉගෙන ගැනීමට අවස්ථාව සලසයි. ජාතියේ දියුණුව සඳහා සංස්කෘතිය හා අධ්‍යාපනය අවශ්‍ය වූවකි. මෙම අවශ්‍යතාව බොහෝ දුරට මහජන

පුස්තකාල සපුරාලයි."( ඊශ්වරි කොරයා) මේ අනුව අඛණ්ඩ වූ ද, යාවජීව වූ ද අධ්‍යාපනයක් සලසන පොදු ආයතනයක් ලෙස මහජන පුස්තකාල පෙන්වා දිය හැකිය. ප්‍රාදේශිය සභා, නගර සභා හා මහ නගර සභා යටතේ පාලනය වන මෙම මහජන පුස්තකාල තම ප්‍රාදේශීය උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරනු ලබයි. එනම්

- අධ්‍යාපනික අරමුණු
- ඉගෙනුම් හා ඉගැන්වීම් අරමුණු
- පර්යේෂණ අරමුණු
- විනෝදාත්මක අරමුණු

මේ අනුව විවිධ උපයෝජක කණ්ඩායම් හමුවේ ඉහත සඳහන් තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම උදෙසා මහජන පුස්තකාලයේ අභ්‍යන්තර සේවා සැකැස්ම බොහෝ දුරට සකස් වන්නේ මෙසේය.

ළමා අංශය
බැහැර දෙන අංශය
වාර සඟරා අංශය
විමර්ශන අංශය
ආදී අංශයන්ගෙනි.

ඉහත දක්වන ලද අංශ අතුරින් මහජන පුස්තකාලයක විමර්ශන අංශය තම පාඨක ප්‍රජාව වෙත සපයන සේවාවන් මොනවාද? එම සේවාවන් ප්‍රමාණාත්මකද? යන්න විමර්ශන පුස්තකාලයාධිපතිවරයකුගේ කාර්යභාරය විමසීමේ දී අවධානය යොමු කළ යුතුය.

## විමර්ශන සේවයක අවශ්‍යතාව

සාර්ථක විමර්ශන සේවාවක් අවශ්‍ය වන්නේ

01. පර්යේෂණයන්හි විෂයාන්තර සම්බන්ධතාව
02. තොරතුරුවල විසිර යාම
03. තොරතුරුවල අඛණ්ඩ වර්ධනය
04. පොත් පත්වල මිල අඛණ්ඩව ඉහළ යාම

( වීරසිංහ, 1998, පිටු . 8-9)



යන කරුණු නිසා තනි පුද්ගලයෙකුට හෝ ආයතනයකට සියලු ප්‍රකාශන අත්පත් කර ගත නොහැකිවේ. තොරතුරු බහුල වීම නිසා උපයෝජකයා තොරතුරු අතර හිරවීමත්, සාධිකාරී මූලාශ්‍රවල ඇති හිඟකමත් නිසා විමර්ශන සේවාව නූතනයේ දී අත්‍යාවශ්‍ය සේවයක් ලෙස නම් කළ හැකිය. මහජන පුස්තකාලය තම පුස්තකාලයට වෙන් කරන මුදල් ප්‍රතිපාදන මගින් උසස් විමර්ශන මූලාශ්‍ර අත්පත්කර ගැනීමෙන් හා Inter library loan (අන්තර් පුස්තකාල පිරුළු සේවා) මගින් පොත් හුවමාරු කොට උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා විමර්ශන සේවාව ඉහළ මට්ටමකින් පවත්වා ගත යුතු වේ.

## මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයාගේ භූමිකාව

විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙක් යනු පුස්තකාලයක තොරතුරුවලින්, දැනුමෙන් පරිණත පුද්ගලයෙකි. ආචාර්ය S.R රංගනාදන්ට අනුව විමර්ශන පුස්තකාලයාධිපතිවරයා ග්‍රන්ථ ලෝකය පිළිබඳ කුතුහලයකින් සිටිය යුතු පුද්ගලයෙකි. විල්සන් සහ ටෝර්බර් අදහස් දක්වන පරිදි මනා පුහුණුවක් විමර්ශන පුස්තකාලයාධිපතිවරයාට තිබිය යුතුය (වීරසිංහ, 1998, පි. 10). විලියම් බී වයිල්ඩ් නම් පුස්තකාලයාධිපතිවරයා පවසන පරිදි විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙක් සතු විය යුතු ගුණාංග තුනක් මෙසේ දක්වයි ( බී වයිල්ඩ්, විලියම්, 1891).

එනම්

01. පළපුරුද්ද
02. පළපුරුද්ද
03. පළපුරුද්ද

මේ අනුව මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයා දැනුමෙන් පරිපූර්ණ, උපයෝජක තොරතුරු අවශ්‍යතාවන් සම්පූර්ණ කළ හැකි පුද්ගලයෙක් විය යුතු බව මොනවට පැහැදිලිය. පහතින් විදේශීය මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙකුගෙන් බලාපොරොත්තු වන සේවය බඳවා ගැනීමේ කොන්දේසිවල දක්වා ඇත්තේ මෙසේ ය.

02 OCT 2015

## Librarian I – Reference Librarian

**JOB SUMMARY**

Under the direct supervision of the Head of Merrillville Branch, to provide reference service to the public and to do related tasks as assigned.

**WORK PERFORMED**

- Providing reference and instructional services in individual and group settings using print and electronic information sources
- Creating library publications, including bibliographies, guides and Web-based resources
- Collection development of the reference and circulating collection, through selection and weeding in assigned subject area
- Contributing to the evaluation and development of reference services and collections
- Maintaining current awareness and use of emerging information and library technologies
- Promoting library collections, technology and services through presentations, programs, and topical displays.
- Plan, publicize and implement adult programs and displays
- Conduct instructional tours of library facilities
- Promote library services through outreach activities such as school and community visits
- Provide readers advisory
- Maintain discipline and order in the library
- Maintain basic circulation skills
- Substitute at branches as needed
- Perform related workroom duties as assigned

(උපුටා ගැනීම http://www.southchina.lib.me.us/Library/Welcome.html)

ඉහත දක්වන ලද සේවාවන් විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙකු විසින් කළ යුතු බව South China Public Library තම සේවා කොන්දේසිවල දක්වා ඇත. මේ පිළිබඳ මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙකුගේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී පුළුල් ව අදහස් දක්වනු ලැබේ.

### මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙකුගේ කාර්යභාරය

මෙහි දී මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයා සාම්ප්‍රදායික ක්‍රමවේදයන් ඉක්මවා ගොස් නවීන තාක්‍ෂණය හා බද්ධව, දක්‍ෂව තොරතුරු කළමනාකරුවෙකුගේ භූමිකාවේ කටයුතු කරන්නේ කෙසේ ද? කළ යුත්තේ මොනවාද? යන්න මෙහිදී සාකච්ඡා කළ යුතුව ඇත. පාඨක සේවාවේ හදවත විමර්ශන සේවාව බව W.K.M.M.K වීරසිංහ මහතාගේ අදහසයි (වීරසිංහ,1998, පිටු. 8-12).



පොදුවේ පුස්තකාල ක්‍ෂේත්‍රයේ ද සාර්ථක පුස්තකාල සේවාවක පදනම විමර්ශන සේවාව බව නොයෙක් තැන්හි දක්වා ඇත. එසේ නම් එකී කර්තව්‍යය සාක්‍ෂාත් කර ගැනීම උදෙසා මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයා විමර්ශන පුස්තකාලයාධිපතිවරයෙක් ලෙස ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි විමසා බැලිය යුතුය. මෙහි දී පළමුව විමර්ශන සේවයක් යනු කුමක්ද යන්න පැහැදිලි කරගත යුතුය.

"විමර්ශන සේවය යනු පුස්තකාලයට පැමිණෙන පාඨකයන්ට අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා පුස්තකාලයාධිපතිවරයා විසින් දෙනු ලබන සහයෝගයයි."

(විලියම් වර්නර් බිෂෝප්)

"කුමක් හෝ අරමුණක් අරබයා පුස්තකාලය තුළ තොරතුරු සොයන පාඨකයන්ට පුස්තකාලයාධිපතිවරයා හෝ අදාළ වෘත්තීය වේදියා පෞද්ගලිකව සහය වීම විමර්ශන සේවාවයි."

(මාහුම් පාවින්)

"විමර්ශන සේවය වශයෙන් හඳුන්වන්නේ අවශ්‍ය පාඨකයාට අවශ්‍ය පොත අවශ්‍ය ආකාරයෙන් මුණගැස්සවීමේ ක්‍රියාවලියයි."

(ආචාර්ය එස් .ආර්. රංගනාදන්)

තව ද Glossary of library and information science – 2004 හි විමර්ශන සේවාවේ කාර්යභාරය මෙසේ විස්තර කර ඇත. " පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා සඳහා පුස්තකාලයේ තොරතුරු මූලාශ්‍රයන්ගෙන් තොරතුරු සැපයීමට සමත්, පුහුණුව ලත් පුස්තකාලයාධිපතිවරයෙකු සේවය කරන විමර්ශන අංශය මගින් සිදු වන්නා වූ සියලුම කාර්යයන් විමර්ශන සේවය වේ. පාඨකයාට ප්‍රතිචාර දැක්වීමේ දී දුරකථනය, පුද්ගලයින් මෙන් ම විද්‍යුත් තැපැල භාවිත කරනු ලබන අතර කිසිදු සීමා කිරීමකින් තොරව විමර්ශන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිදු කරයි. තොරතුරු සෙවීම සඳහා භාවිත කරන විධිමත් උපක්‍රම හා තාක්‍ෂණය, විවිධ ගවේෂණයන් පාඨකයින් වෙනුවෙන් මෙහෙයවීම, පුස්තකාලයේ සම්පත් වෙත පාඨකයින්ට මග පෙන්වීම, තොරතුරු ඇගයීමේ දී සහය වීම, විමර්ශන සංඛ්‍යාලේඛන තබා ගනිමින් පාඨකයින්ගේ විමර්ශනයේ විධිමත් භාවය ඉදිරිපත් කිරීම,

විමර්ශන එකතුවේ සංවර්ධනයට සහයවීම විමර්ශන පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යයන් වේ" ඉහත නිර්වචනයන්ට අනුව පොදුවේ විමර්ශන සේවයක් යනු පුස්තකාලය වෙත පැමිණෙන උපයෝජකයින්ගේ තොරතුරු අවශ්‍යයතා සම්පූර්ණ කිරීමයි. මහජන පුස්තකාලයක විමර්ශන අංශය මගින් ද එකී සේවාව සිදු කළ යුතුමය. කොළඹ මහජන පුස්තකාලය තම පුස්තකාලයේ විමර්ශන අංශයේ කාර්යභාරය පුස්තකාලයීය Web Page හි දක්වා ඇත්තේ මෙසේය.

**Reference Service**

An "Inquiry Service" which is attached to the reference section entertains readers for their subject and academic information requirements. This service provides directional and referral information and guides the readers to the correct materials. Readers are also provided an opportunity to request materials from outside sources on Inter Library Loan scheme operated in the reference section.

(උපුටා ගැනීම : http://www.colombopubliclibrary.org/)

මේ අනුව ද විෂයාත්මක හා අධ්‍යාපනික තොරතුරු පාඨක අවශ්‍යතාවය අනුව ලබා දීම, නිවැරදි මූලාශ්‍ර සඳහා මග පෙන්වීම තම මුඛ්‍ය අරමුණ ලෙස දක්වා ඇත.

**විමර්ශන ග්‍රන්ථ තේරීම**

මහජන පුස්තකාලයක හෝ වෙනත් පුස්තකාලයක පළමු කාර්යය විය යුත්තේ තම උපයෝජක කණ්ඩායම් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන එකතුවක් සංවර්ධනය කර ගැනීම වේ. මහජන පුස්තකාල ප්‍රමිතියක් වශයෙන් විමර්ශන ග්‍රන්ථයක් හැඳින්විය යුත්තේ '' විමර්ශනය සඳහා නිරන්තරයෙන් ම පුස්තකාලයේ තිබිය යුතු වූද, ඒ නිසාම බැහැර දිය නොහැකි වූ ද ග්‍රන්ථයක් "
(ALA glossary of library & information science, 1983, p. 188)
යනුවෙනි. සාමාන්‍යයෙන් විමර්ශන ග්‍රන්ථවල මිල අධිකය. එසේම



නිරතුරුවම පැරණි සංස්කරණ ඉවත් කොට නව සංස්කරණ ලබා ගත යුතුය. විශේෂයෙන්ම දියුණු වන රටවල පුස්තකාලයෙන් බැහැර කිසියම් තැනකින් නිවැරදි තොරතුරු ලබා ගැනීම උගහට බැවින් ඉතා කුඩා ජනාවාසයක වුවත් මූලික විමර්ශන ග්‍රන්ථ එකතුවක් ගොඩ නඟා ගැනීම අවශ්‍ය වේ. ප්‍රශ්නයක්ව ඇත්තේ දියුණු වන රටවල, ඒ රටවලට අදාළ තොරතුරු අඩංගු ස්වභාවයෙන්ම ලියැවුණු විමර්ශන ග්‍රන්ථවල හිඟකමය.

ජනගහනය 3000 කින් යුත් ප්‍රදේශයක පිහිටි පුස්තකාලයකට යටත් පිරිසෙන් විමර්ශන ග්‍රන්ථ 100 ක්වත් අවශ්‍යය. මීට වඩා ජනගහනයෙන් යුත් ප්‍රදේශවල සියයට දහයක්වත් විමර්ශන ග්‍රන්ථවලින් සමන්විත විය යුතුය. මීටත් වඩා විශාල ජනගහනයක් යුත් ප්‍රදේශවල එම අනුපාතය තවත් වැඩි විය යුතුය. විමර්ශන ග්‍රන්ථවල මිල අධික හෙයින් පුස්තකාල වෙත පැවරෙන බර අඩුකර ගැනීම සඳහා වෙනත් ප්‍රාදේශීය පුස්තකාල හෝ ජාතික පුස්තකාල සමග හුවමාරු ක්‍රමයක් පවත්වාගෙන යාම ප්‍රයෝජනවත්ය. ශාඛා පුස්තකාල ඇතුළු සියලුම පුස්තකාලයන්හි ළමා පාඨකයන්ගේ විමර්ශන අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ළමා අංශයෙහි ඔවුනට සුදුසු විමර්ශන කෘති සපයා තිබීම අවශ්‍යය. ලොකු ළමයින් සාමාන්‍ය විමර්ශන ග්‍රන්ථ භාවිතයට හුරු කළ යුතුය.

පහත නිර්වචනයන්ට අනුව විමර්ශන කෘතියක් යනු පුස්තකාලයෙන් බැහැර නොදෙන තොරතුරු අවශ්‍යතාවට පමණක් භාවිත කළ යුතු කෘති විශේෂයකි .

"විමර්ශන ග්‍රන්ථයක් යනු සුවිශේෂී තොරතුරක් ලබාගැනීමට පමණක් කියවිය යුතු එහෙත් එක දිගට නොකියවිය යුතු ග්‍රන්ථයකි."

(පුස්තකාල විඥාපන විද්‍යා විශ්ව කෝෂය)

තවද

"කිසියම් හේතුවක් නිසා පුස්තකාලයෙන් බැහැර නොදෙන පුස්තකාලය තුළදීම පමණක් පරිශීලනය කළයුතු ග්‍රන්ථයකි"

(ALA ශබ්ද මාලාව)

මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයා විමර්ශන ග්‍රන්ථ අත්පත් කර ගැනීමේ දී පළමුව තම උපයෝජක පිරිස පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. එසේම විමර්ශන කෘතියක් තෝරා ගැනීමේ දී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍යය.විමර්ශන කෘතියක් තේරීමේ දී

සාධිකාරීත්වය - Authority
අරමුණ - Purpose
පාඨක ප්‍රජාව - Audience
වින්‍යාසය - Arrangement
නවතාවය - Currency
ආකෘතිය - System
විෂය ආවරණය - Coverage
මිල - cost
භෞතික නිමාව - Format

විමර්ශන කෘතියක් තේරීමේ දී ඉහත දක්වන ලද කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුත්තේ අන්තර්ගත තොරතුරුවල විශ්වාසනීයභාවය, අවශ්‍යතාවයන්ට උචිත බව, පැහැදිලි හා නිශ්චිත බව, භෞතික ස්වරූපයෙන් උසස් කෘති තම පුස්තකාලයට අත්පත් කර ගැනීම යන කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහාය. මෙමගින් මහජන පුස්තකාලයට හොඳම පොත් එකතුවක් සංවිධානය කර ගත හැකි වේ. පුස්තකාල හා විඥාපන විද්‍යා විශ්වකෝෂය දක්වන අන්දමට ඕනෑම පුස්තකාලයක තිබිය යුතු විමර්ශන කෘති මෙසේය.

ග්‍රන්ථ නාමාවලි - Bibliographies
ශබ්දකෝෂ - Dictionaries
විශ්වකෝෂ - Encyclopedias
වාර්ෂික ග්‍රන්ථ - Year books
නියමාවලි - Manuals
චරිතාපදානාත්මක මූලාශ්‍ර - Bio – graphical resources
අනුක්‍රමණිකා - Indexes
මාලික ප්‍රකාශන - Serials



අත්පොත් - Handbooks
නාමාවලි - Directories
භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර - Geographical resources
රජයේ ප්‍රකාශන - Government Publication
ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර - Audio – visuals resources
පරිගණක මූලාශ්‍ර - Computer resources
අන්තර්ජාලය - Internet

මේ අනුව මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයා

- වයස්පරතරය
- ජාතිය
- ආගම
- අධ්‍යාපන මට්ටම්
- විවිධ අවශ්‍යතා

යන ප්‍රධාන කරුණු විමර්ශන කෘතියක් පුස්තකාලයට අත්පත් කර ගැනීමේ දී අවධානයට යොමු කළ යුතු අතර එකතුව සියල්ලන්ටම පොදු වන ලෙස සංවර්ධනය කර ගත යුතුය. මේ අනුව උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා විමර්ශන පුස්තකාලයාධිපතිවරයා තම එකතුව සංවර්ධනය කිරීමට නිතරම උත්සුක විය යුතුය. එසේම තම පුස්තකාලය සතු විමර්ශන කෘති පිළිබඳ දේශන හෝ වෙනත් ක්‍රමවේද භාවිතයෙන් උපයෝජකයන් දැනුවත් කළ යුතුය. අවශ්‍ය පාඨකයාට අවශ්‍ය වේලාවේ දී අවශ්‍ය පොත අවශ්‍ය ආකාරයෙන් ලබා දිය යුතුය යන මූල ධර්මයට මහජන පුස්තකාලයේ විමර්ශක පුස්තකාලයාධිපතිවරයා ද අනුගත විය යුතුය. පහතින් උපයෝජක අවශ්‍යතාවයට විමර්ශන කෘතියක් උපයෝගී වන්නේ කෙසේදැයි දක්වා ඇත.

වගු අංක 01

| NEEDS ( For information about…) | SOLUTIONS (Choose) |
|---|---|
| Word | Dictionary |
| General information/ Overview of topic | Encyclopedias |
| Names & addresses of people, organization, Institutions, companies | Directories |
| Profiles of people | Biographical Dictionaries |
| Places/ Maps | Gazetteers or Atlases |
| Facts and Statistics | Almanacs |
| Formula, Tables, How – To- Do –It | Handbooks and Manuals |
| A person's work | Review or Criticisms |
| Dates, outlines, historical timelines | Historical tables, Chronologies, Historical yearbooks |
| Periodical Articles | Indexes or Abstracts |
| Books and other sources | Bibliographies or Guide to Literature |

(උපුටා ගැනීම : http://work.chron.com/reference-librarian-duties-11375.html)

**විමර්ශන සේවා**

විමර්ශන මූලාශ්‍රයක් පදනම් කරගෙන පුස්තකාලයාධිපතිවරයාට තම උපයෝජකයන් උදෙසා සැපයිය හැකි සේවාවන් 02 කි (වීරසිංහ, 1998, පිටු. 11).



එනම්

01. ප්‍රතිචාරාත්මක සේවා ( Responsive Services)

02. අපේක්ෂණීය සේවා (Anticipatory Services)යනුවෙනි.

මේ අනුව උපයෝජකයින්,

- සෘජු විමසීම් සඳහා තොරතුරු සැපයීම
- ක්ෂණික විමර්ශන සඳහා තොරතුරු සැපයීම
- නියත ගවේෂණාත්මක විමසීම් වෙනුවෙන් තොරතුරු සැපයීම
- පර්යේෂණාත්මක විමසීම් සඳහා තොරතුරු ලබා දීම

ආදී (වීරසිංහ, 1998, පි.10 දක්වා ඇති පරිදි) සේවාවන් සැපයීම විමර්ශන පුස්තකාලයාධිපතිවරයා සිදු කළ යුතු අතර මේ සඳහා වගු අංක 01 පාදක කර ගත හැකිය. විමර්ශන පුස්තකාලයක් වශයෙන් මහජන පුස්තකාලයකින් කළ හැකි වෙනත් සේවාවන් මෙසේ දැක්විය හැකිය (ප්‍රේමදර්ශන,2011, පි. 129 - 130).

- විමර්ශන පුස්තකාලයට අත්කර ගත් නව ප්‍රකාශන ප්‍රදර්ශනය කිරීම
- විශේෂ තොරතුරු ලැයිස්තු සැකසීම හා ප්‍රදර්ශනය කිරීම
- පටුන පිටු සේවාවක් පවත්වා ගෙන යාම
- වාර සඟරා සේවාව සැපයීම
- සම්මන්ත්‍රණ වාර්තා, වාර්ෂික වාර්තා ආදිය රැස් කිරීම
- සම්මුඛ සාකච්ඡා හා වෙනත් දේශන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය තුළින් භාවිතයට ඉඩ සැලසීම
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- විමර්ශන මූලාශ්‍ර සම්බන්ධයෙන් වැඩසටහන් පැවැත්වීම
- දේශන, චිත්‍රපට, සම්මන්ත්‍රණ පැවැත්වීම
- 

1995 වර්ෂයේ මිචිගන් විශ්වවිද්‍යාලයේ දී අන්තර්ජාල මහජන පුස්තකාල (Internet Public Libraries) සම්බන්ධයෙන් කරන ලද තොරතුරු ගවේෂණයේ දී විමර්ශන පුස්තකාලයාධිපතිවරයකු අවධානය යොමු කළ යුතු කරුණු මෙසේ දක්වා ඇත. මෙම කරුණු අන්තර්ජාල පරිසරයක් තුළ පමණක් නොව ඕනෑම පරිසර තත්වයක දී

විමර්ශන පුස්තකාලයාධිපතිවරයා අවධානය යොමු කළ යුතු වැදගත් කාරණා ලෙස සඳහන් කළ හැකිය (Joseph, 2009, p.34).

- උපයෝජකයන් හා ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම
- වැඩි පුහුණුවක් හා වැඩි දියුණුවක් අත් කරගැනීම
- විමර්ශන පුස්තකාලයාධිපති අනෙකුත් පුස්තකාලයාධිපතිවරු සමඟ සමීප සම්බන්ධතා ඇති කර ගැනීම
- විද්‍යුත් විමර්ශන සේවය සඳහා පැහැදිලි යොමු ගත සේවා සැපයීම
- උපයෝජක අවශ්‍යතා හා ඔවුන්ගේ ඉල්ලීම් පිළිබඳ මනා වැටහීමක් තිබීම
- උපයෝජකයන් සඳහා ඇති පහසුකම් ගැන අවබෝධයක් තිබීම
- යහපත් තොරතුරු තාක්ෂණ දායකත්වය සම්පූර්ණ වන සේ එකට එක්කොට උපයෝජකයන්ට ලබාගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම
- තාක්ෂණය ගැන කාර්යක්ෂමව සිට සහය දක්වීම
- තොරතුරු ජාල තුළින් තොරතුරු ලබාගැනීමේ දී විෂය විශේෂඥතාවක් දක්වීම
- ඉක්මනින් හා පහසුවෙන් තොරතුරු ලබාදීමේ තොරතුරු කුසලතා වර්ධනය කර ගැනීම

යන කාරණා පිළිබඳ අවධානය යොමු කරමින් විමර්ශන සේවාවන් පවත්වාගෙන යා යුතුය. අවසාන වශයෙන් මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරා තම උපයෝජකයන් වෙත පහත සේවාවන් ලබා දීම කළ යුතු වේ (වීරසිංහ, 1998, පි. 11-12).

- විශේෂිත මාතෘකා පිළිබඳ ග්‍රන්ථනාමාවලි සම්පාදනය
- කාලීන සම්ප්‍රජානන සේවය
- පුවත්පත් කැපුම් සේවය
- අනුක්‍රමණිකා සේවය
- සාර සංග්‍රහ සේවය



- පාඨක අධ්‍යාපනය
- පාඨක අනුස්ථාපනය

උපයෝජකයාගේ තොරතුරු අවශ්‍යතාව කුමක් වුවත් එම අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් තොරතුරු සැපයීම විමර්ශන සේවාවේ පොදු ලක්ෂණය වේ. එම නිසා මෙම සේවාව Information Services හෙවත් තොරතුරු සේවා ලෙස ද නම් කළ හැකිය. වර්තමානයේ අන්තර්ජාලය හරහා ද, ඇතැම් මහජන පුස්තකාල තම විමර්ශන සේවා පවත්වා ගෙන යනු ලබයි. මේ අනුව ඉහත දී විස්තර කළ පරිදි මහජන පුස්තකාලයේ විමර්ශන සේවාව විධිමත් ව හා ක්‍රමානුකූලව සකස් කිරීමේ වගකීම එහි විමර්ශන පුස්තකාලයාධිපතිවරයා සතු වන අතර ආචාර්ය S.R රංගනාදන්ගේ පංච නීතියට අනුව උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම ඉතා වැදගත්ය.

➢ පොත් ඇත්තේ භාවිතය සඳහායි
➢ සෑම පාඨකයෙකුට ම පොතක් තිබිය යුතුය
➢ සෑම පොතක් සඳහා ම පාඨකයෙක් සිටිය යුතුය
➢ පාඨකයාගේ කාලය ඉතිරි කළ යුතුය
➢ පුස්තකාලය වර්ධනය වන ආයතනයකි

යන මූලධර්ම සාක්ෂාත් කිරීම උදෙසා විමර්ශන පුස්තකාලයාධිපතිවරයා

01. නිත්‍ය විමර්ශන කෘති
02. සාමාන්‍ය විමර්ශන කෘති
03. වාර සඟරා අංශය
04. දුර්ලභ කෘති අංශය
05. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය

යටතේ විමර්ශන මූලාශ්‍ර පෙළ ගස්වා ගෙන උසස් විමර්ශන සේවාවක් මහජන පුස්තකාල මගින් ඉටු කිරීම මහජන පුස්තකාලයක පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරය වේ.

## නිගමනය

මහජන පුස්තකාලයක විමර්ශන පුස්තකාලයාධිපතිවරයා එහි ප්‍රධාන තොරතුරු කළමනාකරුවා වන අතර ම අනෙකුත් පුස්තකාල සේවාවන් අතර විමර්ශන සේවාව ප්‍රමුඛතම සේවාව වේ. මෙහි දී එකී කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනයක් සිදු කර ඇත. මේ අනුව මහජන පුස්තකාලයකින් තම උපයෝජකයන්ට සිදු කළ යුතු විමර්ශන සේවාවන් නො අඩුව සම්පූර්ණ කිරීම පුස්තකාලයාධිපතිවරයාගේ වගකීම වන අතර එවිට 'පුස්තකාලයේ හදවත විමර්ශන සේවාවයි' යන අරුත් දැක්වීම මොනවට විසද කර දක්විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

01. අමරසිංහ, එන් (සංස්)(1987), මහජන පුස්තකාල ප්‍රමිත, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

02. ගුණරත්න, ඊ. කේ (2005), "විමර්ශන සේවාව හා මූලික විමර්ශන ග්‍රන්ථ" පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය. පි. 109 - 120

03. ප්‍රේමදර්ශන, විජය (2007), විමර්ශන පුස්තකාල, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ.

04. වීරසිංහ,ඩබ්.කේ.එම්.එම්.කේ (1998), 'පාඨක සේවාවේ හදවත විමර්ශන සේවාවයි' පුස්තකාල ප්‍රවෘත්ති, වෙ.22, ක.02, පි. 20 22

05. Glossary of library and information science – 2004

06. Harrod's Librarians Glossary and reference book, 2000, Gower Publishing Co, England.

07. Josheph, Janes (2009) , "Internet Librarian (To Boldly Go),American Libraries, Vol. 56, No. 01, 63 -71 p.

08. "Knowledge in a Research Organization" 2006, Libri, Vol. 56, No. 01, 63 – 71 p.



09. Katz, Bill (Ed) 2000, New Technology and Reference Services, The Hawoth Press, London.

10. Kumar, Krishan (1987), Reference Services, Vikas Publishing House, New Delhi.

**Web Resources**

http://library.uaf.edu/ls101-reference-services

http://www.southchina.lib.me.us/Library/Welcome.html

http://work.chron.com/reference-librarian-duties-11375.html